museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2023 සැප්තැම්බර්

# ශ්‍රී ලංකාව කලා සංචාරක කර්මාන්තය දෙස අවධානය යොමුකළ යුත්තේ ඇයි?

> "සංස්කෘතියක් නොමැතිව සංචාරක කර්මාන්තය පවතින්නේ නැත. මිනිසුන්ගේ සංචලනය සඳහා සංස්කෘතිය ප්‍රධාන පෙළඹවීමක්වන අතර, ඕනෑ ම ආකාරයක සංචාරක කර්මාන්තයක් ආගන්තුකයා මෙන් ම සත්කාරකයා මත සංස්කෘතික බලපෑමක් ඇතිකරයි."
>
> මහාචාර්ය ජෆාර් ජෆාරි, සංචාරක හා හෝටල් කර්මාන්තයේ විශේෂඥ හා න්‍යායාචාර්

වසංගතයක් සහ ආර්ථික හා දේශපාලන අර්බුදයක් ඇතිකළ කැළඹිල්ලට පසුව ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය 2023දී සුභවාදී ප්‍රකෘතියක් ආරම්භකර ඇත. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට (SLTDA) අනුව, මෙම වසරේ ජනවාරි මාසයේ සිට සංචාරක පැමිණීම් සංඛ්‍යාව ඉහළ නැගෙන ප්‍රවණතාවකින් යුත් අතර, ජූලි මස පැමිණි සංචාරකයන්ගෙන් 52%කට ආසන්න ප්‍රමාණයක් විනෝදයට හෝ නිවාඩුවක් ගතකිරීමට පැමිණි අය වේ.

කලාව, සංස්කෘතිය, හා ඉතිහාසය සොයා ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයන් පිළිබඳව කතාකරමින් Walker Toursහි සුඛෝපභෝගී හා සූචිත වෙළඳ නාමයක්වන ArTravelෙහි Artisan in Travel ලෙස කටයුතුකරන ස්ටෙෆනි ප්‍රනාන්දු පැවසුවේ, "ඔවුන්ගේ අවශ්‍යතා උපරිමයෙන් ම ඉටුකරන්නේ කෙසේදැයි යන්නට රටක් වශයෙන් අපි අවධානය යොමුකළ යුතුයි. කලාව හා සංස්කෘතිය සංචාරක කර්මාන්තය සමඟ සම්බන්ධකිරීම වැදගත්වන අතර, එමගින් රටේ විශේෂිත ප්‍රදේශවලට අමුත්තන් ගෙන්වා ගැනීමට අපිට පුළුවන්. මෙහි ප්‍රතිඵලයක් ලෙස නිර්මාණාත්මක ව්‍යවහාර හරහා මෙරට විවිධ ප්‍රදේශ ප්‍රාණවත් කිරීමෙන් ප්‍රජා යහපැවැත්ම ඇතිවෙයි" යනුවෙනි.

ඒ හා සමාන රුචිකත්වයක් සහිත සංචාරකයින් කණ්ඩායමක් ආකර්ෂණයකර ගැනීමට කලා සංචාරක කර්මාන්තයට හැකි ය. කලා උළෙලවල්, ගැලරි, සහ කෞතුකාගාර වැනි ගමනාන්තවල කලාව හා එය පාදකකරගත් ක්‍රියාකාරකම් අත්විඳීමට හා, ඒවායේ නියැලීමට සංචරණයකිරීම කලා සංචාරක කර්මාන්තයේ

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

කොටසකි. මැනවින් පෝෂිත ඉතිහාසයකින්, සංස්කෘතියකින්, හා ස්වභාවික සුන්දරත්වයකින් පිරිපුන් ශ්‍රී ලංකාව කලා සංචාරක කර්මාන්තය සඳහා කදිම ගමනාන්තයකි. සංගීතය, නැටුම්, සාහිත්‍යය, සහ දෘශ්‍ය කලා ඇතුළු විවිධ කලා සම්ප්‍රදා සහ, දේශීය හා ජාත්‍යන්තර කලා වේදිකාවල තමන්ට ම නමයක් හදාගනිමින් සිටින නූතන හා සමකාලින කලාකරුවන් මෙරට ඇත.

ශ්‍රී ලංකාවට සිය කලා, සංස්කෘතික, හා සංචාරක ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමට විවිධ ක්‍රමවේද ගොඩනැගිය හැක. මෙය කළ හැක්කේ කෙසේ ද යන්න පිළිබඳව අදහස් දක්වමින් හෝටල්කරු, ආපනශාලා පාලක, විලාසිතා සහ අභ්‍යන්තර ගෘහ නිර්මාණ ශිල්පී, සහ උත්සව සැලසුම්කරු නයන්තරා 'ටාරු' ෆොන්සේකා පැවසුවේ, "රටේ සුවිශේෂී කලා හා සංස්කෘතික අත්දැකීම් ඉස්මතුකරන පැකේජ හරහා අපි සංස්කෘතික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයකළ යුතුයි. මෙයට ඓතිහාසික ස්ථාන, කලාගාර, කෞතුකාගාර, හා සාම්ප්‍රදායික සංගීත හා නැටුම් උත්සව නැරඹීම් ඇතුළත් විය හැක. අපි දේශීය ශිල්පීන් ප්‍රවර්ධනය කළහොත්, සංචාරකයින් සඳහා සුවිශේෂී සංස්කෘතික අත්දැකීමක් නිර්මාණයකිරීමට ශ්‍රී ලංකාවට හැකි අතර ම, දේශීය ජීවනෝපායන් සඳහා ද සහාය විය හැකියි" යනුවෙනි.

කලාකරුවන්, නරඹන්නන්, සහ අනුග්‍රාහකයන් එක්කරන කලා හා සංස්කෘතික කේන්ද්‍රස්ථානවල ආයෝජනකිරීම හා ඒවා වර්ධනයකිරීම ඉතා වැදගත් ය. සංචාරකයින් ආකර්ෂණය කරගනිමින් විචිත්‍රවත් කලා ප්‍රජාවක් පෝෂණයකිරීමට උපකාරවී, එමගින් ශ්‍රී ලංකාවේ කලා සංචාරක කර්මාන්තය මුළු මහත් කලාපයට සම්බන්ධකිරීමට එවැනි ප්‍රජාවන්ට හැකි ය. ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA ශ්‍රී ලංකා) යනු ශ්‍රී ලංකාවේ නූතන සහ සමකාලීන කලාව වටා කලාකරුවන්, අනුග්‍රාහකයින්, සහ නරඹන්නන් ප්‍රජාවක් ගොඩනැගීම උදෙසා කටයුතුකරන සංවිධානයකි. ශ්‍රී ලංකාවේ කලා සංචාරක කර්මාන්තයක් සඳහා වෙළඳපොලක් පිහිටුවීමට ඔවුන් කරන කාර්යය පිළිබඳව කතාකරමින් MMCA ශ්‍රී ලංකාහි ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා පැවසුවේ, "සංචාරකයින් ආකර්ෂණයකර ගැනීමට කොළඹ සතුව සවිමත් සංස්කෘතික වටපිටාවක් තිබිය යුතුයි. ශ්‍රී ලංකාවේ නූතන හා සමකාලීන කලා ප්‍රදර්ශනයකිරීමට කැපවූ එක ම කෞතුකාගාරය MMCA ශ්‍රී ලංකායි. නූතන කලා කෞතුකාගාර, විශේෂයෙන් ම ගෘහනිර්මාණ ශිල්පයට සබැඳි ඒවා, සංචාර කර්මාන්තය ඉදිරියට ගෙන යනවා" යනුවෙනි. ඇය තවදුරටත් පැවසුවේ, "ලන්ඩනයේ ටේට්, ගගන්හයිම් බිල්බාඕ, නිව් යෝර්ක්හි මෝමා, සහ සිංගප්පූරු කලා කෞතුකාගාරය සංචාරක ආකර්ෂණ ස්ථානවනවා පමණක් නොව, මෙම නගර සංස්කෘතික ගමනාන්ත ලෙස පිහිටුවීමට ද ඒවා උපකාරවී තිබෙනවා. කලාකරුවන් හා කලා ඉතිහාසයක් තිබෙන අපිට අඩුවට ඇත්තේ MMCA ශ්‍රී ලංකා ස්ථාපිතකිරීමට උත්සාහකරන ආකාරයේ ස්ථිර නූතන කලා කෞතුකාගාරයක් පමණයි" කියා ය.